www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නැගෙනහිර ශ්‍රී ලංකාව තුල සටන් මුත්තූර් නගරයට පැතිරෙයි

**Fighting in eastern Sri Lanka spreads to the town of Muttur**

**වජේ ඩයස් විසිනි**
**2006 අගෝස්තු 04**

ශ්‍රී ලංකාවේ හමුදාව සහ දෙමල විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) අතර සටන් තීව්‍ර වේ. එල්ටීටීය තමාට එල්ලවන ප්‍රහාරයන්ට එරෙහිව ප්‍රතිප්‍රහාර එල්ල කරමින් සැපයුම් මාර්ග අවහිර කිරීමට උත්සාහ දරද්දී මාවිල්ආරු සොරොව්ව අත්පත් කර ගැනීමට හමුදාව දරන ප්‍රකෝපකාරී ප්‍රයත්නය, ආන්ඩුව ආරම්භයේදීම ගනන් බැලූ පරිදි, නැගෙනහිර පලාත තම අනසකට යටත් කර ගැනීමේ පුලුල් යුද්ධයක් දෙසට වැඩෙමින් තිබේ.

ජූලි 26 දා සිට දහස් ගනන් හමුදා භටයින් මෙහෙයුමට ඇද දමමින් එල්ටීටීඊ ස්ථාන වලට නැවත නැවතත් ප්‍රහාර එල්ල කෙරුනද හමුදාවට මෙතෙක් සොරොව්ව අල්ලා ගැනීමට නොහැකිව තිබේ. පසුගිය දෙදින පුරා, ත්‍රිකුනාමලයේ ප්‍රධාන වරායේ සිට උතුරට ගමන් කරන මාර්ගයෙහි සහ මාවිල්ආරු සොරොව්වට දකුනෙන් පිහිටි මුත්තූර් නගරය අල්ලා ගැනීම සඳහා, සටනක් වර්ධනය වෙමින් පවතී.

මාධ්‍ය වාර්තාවන් සීමා සහිත වෙද්දී, බදාදා දිනයේ එල්ටීටීඊ භටයින් 200ක් ආන්ඩුවේ පාලන ප්‍රදේශයේ පවතින මෙම නගරයට ඇතුලුවී නගර මධ්‍යස්ථානය දෙසට යාමට සටන් වැදුනු බැව් ආරංචිවේ. එල්ටීටීඊය මුත්තූර් අල්ලා ගත් බැව් හමුදාව ප්‍රතික්ෂේප කල නමුදු එයද සිදු කලේ පැය 36 කටත් පසුව වන අතර තත්වය මෙතෙකුදු අපැහැදිලිය.

මුත්තූර්හි සෑම ප්‍රදේශයකම එල්ටීටීඊ සටන්කරුවන් සිය ගනනින් දැකිය හැකි බැව් අබ්දුල් රවුෆ් පසුගිය බදාදා බීබීසී දෙමල සේවයට පැවැසීය. එල්ටීටීඊය විසින් යටත් කරගෙන සිටින ප්‍රදේශය තුල පිහිටි, නගරයේ සතර කොන්හි වන කඳවුරු වලට හමුදා සෙබලුන් පසු බසින ලද බව ඔහු කීවේය. හමුදාවට නැවත බල ගැන්වීම දුෂ්කර කරමින් එල්ටීටීඊය මුත්තූර් ජැටිය අල්ලා ගෙන ඇති බැව් ඇසින් දුටු වෙනත් සාක්ෂිකරුවෝ පැවසූහ.

කොලඹ පාදක කොට ගත් ඩේලි මිරර් පුවත්පත ආරක්ෂක අමාත්‍යංශයේ ප්‍රකාශයක් උපුටා දැක්වූයේ මෙසේය. "කොටි ප්‍රහාර හේතුවෙන් මධ්‍යම බස් ඩිපෝවේ, දුරකථන දෙපාර්තමේන්තුවේ සහ නගර මධ්‍යස්ථානයේ තිබූ පොලිස් මුර පොලවල් ඉවත් කලා." සරල භාෂාවෙන් කිවහොත් පොලීසිය කවර හෝ ප්‍රතිරෝධයකින් තොරව මුරපොලවල් අත් හැර දමා ඇත.

මංමුලාවටපත් මිලිටරිය නැවත පාලනය අත්පත් කර ගැනීමේ කුලප්පුවෙන් තැන නොතැන නොබලා ෂෙල් ප්‍රහාර එල්ල කරන්නට පටන් ගති. ත්‍රිකුනාමල නාවික කඳවුරේ සිට එල්ල කෙරුනු ප්‍රහාර වැඩිවත්ම මුත්තූර් වැසියෝ සරන සොයා පල්ලි සහ පන්සල් වලට පලා ගියහ.

මෙම ස්ථානයන් සරනාගත කඳවුරු ලෙස පැහැදිලිවම සලකුනු කෙරී තිබියදී පවා ඉන් කීපයකට ප්‍රහාර එල්ල විය. සිය ගනනක් මුස්ලිම් මිනිසුන්, ගැහැනුන් සහ දරුවන් නවාතැන් ගෙන සිටි ඇරැබික් විද්‍යාලයට කාල තුවක්කු ප්‍රහාරයක් එල්ල විය. අවම වශයෙන් දස දෙනෙකු මිය ගිය අතර තවත් පිරිසක් තුවාල ලැබූහ. ශාන්ත අන්තෝනි දෙව් මැදුරට එල්ල වූ මෝටාර් ප්‍රහාරයෙන් අට හැවිරිදි පිරිමි ළමයෙක් මිය ගියේය. ආසන්න රෝහලකට තුවාලකරුවන් ගෙන යමින් තිබූ ගිලන් රියකට එල්ල කල ප්‍රහාරයෙන් දෙදෙනකු එතැනම මිය ගිය අතර තුවාල ලැබූ රියැදුරු පසුව මිය ගියේය.

එච්.ෆාරිස් නම් වූ මුත්තූර්හි රජයේ සේවකයෙක් රොයිටර් පුවත් සේවයට මෙසේ පැවැසීය: "ගෙවල්වලින් බොහොමයකට හානි වෙලා. ජලය, විදුලිය දෙකම නෑ. මැරුනු හරක් පාරවල්වල. පල්ලිය ලග හිටපු අය කිව්ව ආරක්ෂාවට මුස්ලිම් ඉස්කෝලෙට යන්න කියල. ෂෙල් වෙඩිල්ල වදින කොට අපි හිටියෙ එලියෙ." ඔහුගේ පුතා ප්‍රහාරයෙන් තුවාල ලබා ඇත.

ආන්ඩුව සහ හමුදාවේ නියෝජිතයින් ෂෙල් ප්‍රහාරවල වගකීම එල්ටීටීඊය මත පටවන්නට උත්සාහ කලහ. කෙසේ නමුදු, ජනතාවගෙන් බහුතරය මුස්ලිම් වන මුත්තූර්හි පාසැල් සහ අනෙකුත් සරනාගත මධ්‍යස්ථානවලට බෝම්බ දැමීම පිළිබඳව ශ්‍රී ලංකා

මුස්ලිම් කොන්ග්‍රස් හි නායක රවුෆ් හකීම් ඊයේ හමුදාවට චෝදනා කලේය. එල්ටීටීඊයේ විරුද්ධවාදියෙකුවූ හකීම් මෙසේ පැවැසීය: "සිවිල් වැසියන් ඝාතනය කිරීම පිලිබඳ වගකීම ආන්ඩුව භාර ගත යුතුයි...ආරක්‍ෂක හමුදා විසින් සිදු කරන ලද ප්‍රහාර වලින් සිවිල් වැසියන් මිය ගියා." ඒදිරිවාදිකම් වහාම නවතන ලෙස ඔහු කැඳැවුම් කලේය.

පසුගිය දෙදින තුල මුත්තුර්හි ගැටුම් හේතුවෙන් සිවිල් වැසියන් 15ත් 20ත් අතර සංඛතවක් මිය ගොස් ඇත. සෙබලුන් 40 ක් මරා දැමූ බැව් ඊයේ පැවැසූ එල්ටීටීඊය එම සිරුරු භාර දීමට සූදානම් කොට ඇති බව්ද නිවේදනය කලේය.මෙය ප්‍රතික්ෂේප කල හමුදාව පසුගිය සතිය තුල තම සතුරන් 70 කට වඩා මරා දැමූ බවත් තමාට අහිමිවූයේ සෙබලුන් කීප දෙනෙකු බවත් පැවැසීය. මාධ්‍ය තක්සේරුවන්ට අනුව ආන්ඩුව ප්‍රහාරය දියත් කල දිනයේ පටන් මිය ගිය මුලු සංඛතව 150 ට අධිකවේ.

ආන්ඩුව සහ හමුදාව පිලිබඳව හැකි තරම් දීප්තිමත් චිත්‍රයක් පින්තාරු කිරීමට කොලඹ මාධ්‍යයන් දරන උත්සාහය තිබියදී ප්‍රහාරය සැලැසුම් කල අයුරින් ඉදිරියට නොයන බව පැහැදිලිය. මාවිල්ආරු වාරිමාර්ග සොරොව්ව ඉක්මනින් අත්පත් කර ගැනීමට හමුදාව අසමත්වූ තතු යටතේ වෙනත් තැන්වල පිහිටි තම කඳවුරු වලට එල්ලවන එල්ටීටීඊයේ දැඩි ප්‍රහාරවලට මුහුන දීමට සිදුව ඇත. මුත්තුර්හි සිවිල් වැසියනට ෂෙල් ප්‍රහාර එල්ල කිරීම වනාහි බලගතු අනතුරු ඇඟවීමකි. අඩිය පසුපසට ගනු වෙනුවට ආන්ඩුවේ අදහස වන්නේ ව්‍යසනකාරී ප්‍රතිඵල නොතකා ප්‍රහාරය ඉදිරියට ගෙන යාමයි.

මහින්ද රාජපක්ෂ සාමයේ දූතයා ලෙස පෙනී සිටින අතරේම, පසුගිය නොවැම්බරයේ පැවැති ජනාධිපතිවරනයෙන්, සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමයේ (ජාහෙඋ) පිටුබලය මත, යන්තමින් ජයගත් මොහොතේ පටන් එක දිගටම යුද පිලිවෙතක් ඔස්සේ ගමන් කරයි. හමුදාව සහ කරුනා කන්ඩායම වැනි එල්ටීටීඊ විරෝධී සන්නද්ධ කොටස් එල්ටීටීඊය දුර්වල කිරීමේ සහ ප්‍රතිප්‍රහාර සඳහා ප්‍රකුපිත කිරීමේ අරමුනෙන් ප්‍රකෝපකරනයේ හා මිනීමැරීමේ උද්ඝෝෂනයක යෙදී සිටිති.

එල්ටීටීඊයට එරෙහිව, විශේෂයෙන්ම නැගෙනහිර පලාත තුල, මිලිටරි ප්‍රහාරයක් දියත් කිරීම සඳහා මාස ගනනාවක් පුරා ජවිපෙ, ජාහෙඋ සහ අනෙකුත් සිංහල අන්තවාදීහු ආන්ඩුවට පීඩනය යොදමින් සිටිති. සාම සාකච්ඡාවන්හි කවර හෝ නව ආරම්භයකට දැඩි ලෙස විරුද්ධ මෙම වර්ගවාදී කොටස් 2004 දී කරුනා පාර්ශ්වය බිඳී වෙන් වීමෙන් පසු එල්ටීටීඊයේ නැගෙනහිර පලාත තුල ඇතිවූ දුර්වලත්වයේ වාසිය හමුදාව විසින් ඩැහැ ගත යුතු බැව් අවධාරනයෙන් කියා සිටිති.

මාවිල්ආරු සොරොව්ව වසා දැමීම මගින්, හමුදාවට මෙම දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරුනු මූලෝපාය ඔස්සේ ගමන් කිරීම සඳහා පහසු නිමිත්තක් සරලව සම්පාදනය කෙරුනි. ආරම්භයේ පටන්ම එල්ටීටීඊය අවධාරනාත්මකව කියා සිටියේ ආන්ඩුවේ කඩවුනු පොරොන්දු හමුවේ තම දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමේ විරෝධතාවක් ලෙසින් ගොවීන් විසින් සොරොව්ව වසා දැමූ බවත් සාකච්ඡා මගින් එය විසඳා ගත යුතු බවත්ය. කවර හෝ සාකච්ඡාවක් ප්‍රතික්ෂේප කල රාජපක්ෂ සොරොව්වෙන් ජලය ලබා ගන්නා දහස් සංඛතත ජනයාට ජලය ලබා දෙනුවස් ක්ෂනික "මානුෂික" මෙහෙවරක යෙදෙන ලෙස හමුදාවට අන කලේය.

ඊයේ පසුපසට කරනමක් ගැසූ ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල මාවිල්ආරු අර්බුදයට සාකච්ඡාමය විසඳුමක් සඳහා දොර විවෘතව ඇතැයි ප්‍රකාශ කලේය. එල්ටීටීඊය කොන්දේසි විරහිතව සොරොව්ව විවර කරන්නේ නම් ප්‍රදේශයෙන් හමුදාව ඉවත් කර ගන්නා බැව් ඔහු පැවැසීය. "කොටි සූදානම්නම් ඉක්මනින්ම සාකච්ඡා ඇරැඹීමට අපිත් සූදානම්" යැයි පැවසූ ඔහු මෙසේද කීවේය. "අපට නැවත යුද්දෙට යන්න අවශ්‍ය නෑ"

මෙම නරුම ප්‍රකාශයන් සම්බන්ධයෙන් කවරෙකු හෝ විශ්වාසය තැබිය යුතු නැත. සොරොව්ව අත්පත් කර ගැනීම සඳහා ප්‍රහාරයකට යන ලෙස රාජපක්ෂ දුන් විධානයෙන් සතියකටත් වඩා කල් ගතවී 150 දෙනෙකුගේ ජීවිත අහිමි වීමෙන් පසු ආන්ඩුවට යුද්ධයක් අනවශ්‍ය බවත් ප්‍රශ්නය සාකච්ඡා මගින් විසඳා ගත හැකි බවත් ආන්ඩුවේම නියෝජිතයකු දැන් නිවේදනය කරයි. මෙම ක්‍ෂනික වෙනසට පැහැදිලි හේතුවක් වන්නේ සටන් නැවැත්වීමට දරන ප්‍රයත්නයේ කොටසක් ලෙස නෝර්වීජියානු නියෝජිත හැන්සන් බවර් අද දින කොලඹට පැමිනීමයි. රඹුක්වැල්ලගේ මෙම ප්‍රකාශයන් වත්මන් ගැටුම එල්ටීටීයේ කර මත පැටවීමේ සරල උත්සාහයකි.

ශ්‍රී ලංකාව පුරා ගොවීන් සහ ගම්බද දුගීන් ඉතා හොඳින් දන්නා පරිදි ඔවුන්ගේ යහපැවැත්ම පිලිබඳ අංශු මාත්‍ර හෝ තැකීමක් රාජපක්ෂ ආන්ඩුවට නොමැත. මාතර, මාතලේ, හම්බන්තොට, කුරුනෑගල, බදුල්ල සහ මොනරාගල යන දිස්ත්‍රික්කවල සාමාන්‍ය ආදායම නිල දරිද්‍රතා මට්ටම වන මසකට එජ ඩොලර් 21ට වඩා අඩු බැව් සංගනන හා සංඛත ලේඛන දෙපාර්තමේන්තුව මෑතදී සොයා ගෙන ඇත. මෙම ගැඹුරුවන සමාජ අර්බුදයෙන් අවධානය ඉවතට හැරවීම සඳහා ආන්ඩුව

වාර්ගික ආතතීන් අවුස්සමින් රට නැවත යුද්ධයට ඇද දමමින් සිටී.

රාජපක්ෂ ආන්ඩුවේ ආකල්පය එහි සිංහල ස්වෝත්තමවාදී සගයන්ගේ ප්‍රකාශන වලින් වඩාත් පැහැදිලිව අනාවරනයවේ. පසුගිය බදාදා ජවිපෙ පාර්ලිමේන්තු කන්ඩායම් නායක විමල් වීරවංශ මහජන රැලියක් අමතමින් මාවිල්ආරු සොරොච්ච අල්ලා ගැනීම සඳහා හමුදා බලය යෙදීම අගය කල අතර, ප්‍රහාරක මෙහෙයුම් නිමා කොට 2002 සටන් විරාමයෙන් ස්ථාපිත කරන ලද නිලමය තත්වයට නැවත පැමිනෙන ලෙස ඉල්ලා නෝර්වේහි ප්‍රධාන මැදිහත්කරු එරික් සොල්හයිම් පසුගිය සතියේ පලකල අදහස් හෙලා දැකීය. එල්ටීටීඊයට එරෙහි පූර්න යුද්ධයක් සඳහා තල්ලුව දෙමින් සටන් විරාම ගිවිසුම අක්‍රිය ලියැවිල්ලක්යයි ප්‍රකාශ කල වීරවංශ එයින් නිල වශයෙන් ඉවත්වන ලෙස ආන්ඩුවට කැඳවුම් කලේය.

© www.wsws.org